# දිස්ත්‍රික් වාණිජ, කර්මාන්ත හා කෘෂිකාර්මික මණ්ඩලය (MDCCIA)

## මධ්‍යම පළාත් ව්‍යවසායකත්ව සම්මාන - 2025

**අයදුම් කිරීමට උපදෙස්**

1. අයදුම්කරුවන් සපුරාලිය යුතු සුදුසුකම් සහ කාණ්ඩවල වර්ගීකරණය

**සුදුසු අයදුම්කරුවන් :**

- මධ්‍යම පළාතේ (මහනුවර, මාතලේ, නුවර එළිය) ලියාපදිංචි වී දැනට ක්‍රියාත්මක වන ව්‍යාපාර.
- සියලු කර්මාන්ත (ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම, විශාල)
- සියලුම අංශ (නිෂ්පාදන/ කෘෂිකර්මය/ ධීවර/ පශු සම්පත් /සංචාරක/ ආගන්තුක සත්කාර/සේවා)
- අයදුම්කරුවන් තම ව්‍යාපාරය සඳහා නීතිමය සහ ලියාපදිංචි අවශ්‍යතා සපුරාගෙන තිබිය යුතුය.
- මාතලේ දිස්ත්‍රික් වාණිජ කර්මාන්ත හා කෘෂිකාර්මික මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර මේ සඳහා සුදුසුකම් නොලැබේ.

**කාණ්ඩ වර්ගීකරණය (ආදායම සහ සේවකයින් අනුව):**

❖ වාර්ෂික ආදායම අනුව තීරණය කරන ලද කාණ්ඩය, සේවක සංඛ්‍යාව අනුව තීරණය කරන ලද කාණ්ඩයට වඩා වෙනස් නම්, අවසාන කාණ්ඩය විශාල වේ.

| ව්‍යාපාර ස්වභාවය | පරිමාණය | වාර්ෂික ආදායම (රු. මිලියන) | සේවකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| කර්මාන්ත/ නිෂ්පාදන | විශාල | 751 කට වැඩි | 200ට වැඩි |
| | මධ්‍යම | 351 - 750 | 51 - 200 |
| | සුළු පරිමාණ | 20 - 350 | 11 - 50 |
| | ක්ෂුද්‍ර | 20 ට අඩු | 10ට අඩු |
| සේවා | විශාල | 751 කට වැඩි | 200ට වැඩි |
| | මධ්‍යම | 351 - 750 | 51 - 200 |
| | සුළු පරිමාණ | 20 - 350 | 6 - 50 |
| | ක්ෂුද්‍ර | 20 ට අඩු | 5ට අඩු |

### 2. වැදගත් දිනයන්

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2025.10.15
- ජයග්‍රාහක ලැයිස්තු නිවේදනය : 2025.11.15

### 3. අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ආකාරය

- ඉංග්‍රීසි කැපිටල් අකුරු භාවිතා කරමින් ඩිජිටල් පෝරමය ටයිප් කරන්න.
- සෑම කොටසකම සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු සපයන්න. අදාළ නොවේ නම්, "අදාල නොවේ." ලියන්න.
- පිළිතුරු සංක්ෂිප්තව සටහන් කරන්න. (වචන සීමාවන් පිළිබඳ සැලකිලිමත් වන්න.)
  - ❖ ව්‍යාපාරය පිළිබඳ විස්තරය (උපරිම වචන 100)
  - ❖ ව්‍යාපාර මගින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ සත්කාරක වැඩ සටහන් ක්‍රියාකාරකම් CSR (උපරිම වචන 100)
  - ❖ ව්‍යාපාරයේ අනාගත සංවර්ධන සැලසුම් (උපරිම වචන 100)

**4. ඇමිණිය යුතු ලියකියවිලි (අදාළ වන විට අනිවාර්ය වේ)**

- ව්‍යාපාර/සමාගම් ලියාපදිංචි සහතිකය.
- ව්‍යාපාර පැතිකඩ - තිබේ නම්
- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් (NIC) පිටපත.
- මූල්‍ය ලේඛන (පසුගිය මූල්‍ය වර්ෂය)ඃ විගණනය කරන ලද ගිණුම් හෝ සහතික කළ කළමනාකරණ ගිණුම්.
  (ක්ෂුද්‍ර පරිමාණ කාණ්ඩය සඳහා තිබේ නම් පමණක් ඉදිරිපත් කරන්න.)
- අපනයන සහතික (අපනයන විකුණුම් ප්‍රකාශ කර ඇත්නම්).
- පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) - තිබේ නම්.
- සම්මත සහතික (උදාඃ GAP, GMP, ISO, HACCP) - හිමිකම් පෑමක් තිබේ නම්.
- නව නිෂ්පාදන/සේවා පිළිබඳ සාක්ෂි (ඡායාරූප, අත් පත්‍රිකා, පිරිවිතර පත්‍රිකා).
- සේවක සුභසාධන ලියකියවිලි (ප්‍රතිපත්ති, ඡායාරූප, ප්‍රතිලාභ වාර්තා).
- ව්‍යාපාර විසින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ සත්කාරක වැඩසටහනේ සාක්ෂි CSR (ඡායාරූප, ප්‍රතිලාභී ලිපි, රිසිට්පත්).
- පුනර්ජනනීය බලශක්තිය හෝ බලශක්ති කාර්යක්ෂමතා පිළිබඳ සාක්ෂි (ඉන්වොයිස්, බිල්පත්, ස්ථාපන ඡායාරූප).
- සම්මාන/පිළිගැනීම් (පසුගිය වසර 3 තොරතුරු).
- නවම EPF/ ETF වාර්තා පිළිබඳ විස්තර
- අයදුම්පතෙහි සඳහන් කර ඇති සම්මාන වැඩසටහනට අදාළ වෙනත් ඕනෑම අවශ්‍ය ලේඛනයන්.

5. **ඡායාරූපමය සාක්ෂි (නිර්දේශිත)**

- ඡායාරූප (නිෂ්පාදන, නිෂ්පාදනාගාරය /අලෙවිසැල, ව්‍යාපාරය මගින් ක්‍රියාත්මක කරන සමාජ සත්කාර ක්‍රියාකාරකම්) CSR
- අයදුම්කරුගේ නම සහ කෙටි ශීර්ෂ පාඨය සමග සෑම ඡායාරූපයක්ම ලේබල් කරන්න.

**6. මූල්‍ය සහ සංඛ්‍යාත්මක ක්ෂේත්‍ර**

- මූල්‍ය වටිනාකම ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) දක්වන්න.
- මුළු ආයෝජනය - (උදාඃ 31/03/2025) දිනට තක්සේරු කිරීම.
- වාර්ෂික පිරිවැටුම - අවසන් වූ මූල්‍ය වර්ෂය (සහායක ප්‍රකාශ අමුණන්න).

**7. . සේවක තොරතුරු**

- සේවක සංඛ්‍යාවට හිමිකරුවන් ඇතුළත් කරන්න.
- ස්ථිර, ස්ථිර නොවන සහ ආබාධිත සේවකයින් සඳහා නිශ්චිත සංඛ්‍යා සපයන්න.
- ආයතනයේ අර්ධ-කාලීන හෝ තාවකාලික සේවකයන් සිටින්නේ නම් පහත උදාහරනයේ දක්වා ඇති පරිදි සේවකයන් ගණනය කරන්න. උදාඃ අර්ධ කාලීන හෝ තාවකාලික සේවකයන් 10 ක් සිටින්නේ නම් 5ක් සේ සලකන්න.

**8. පරිසරය / බලශක්තිය / අපද්‍රව්‍ය**

- ඔබගේ පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) එකක් තිබේ නම්, එය අමුණන්න. අදාළ නොවේ නම්, " අදාළ නොවේ" යනුවෙන් ලියන්න.
- බලශක්ති කාර්යක්ෂමතා මිනුම් සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය ඇතිනම් විස්තර කරන්න.
- ව්‍යාපාරය විසින් නිකුත් කරන එක් එක් අපද්‍රව්‍ය වර්ගය පරිසරයට හිතකර ලෙස බැහැර කරන ක්‍රමවේද දක්වන්න.

**9. සම්මාන ව්‍යුහය**

- ව්‍යවසායක විශිෂ්ටතා සම්මානය (1)
  මධ්‍යම පළාතේ ඉහළම සමස්ත ව්‍යවසායකයා.
- හොඳම ව්‍යවසායක සම්මාන (12)
  අංශ 3 සඳහා ප්‍රමාණ 4කින් = සම්මාන 12

| ව්‍යාපාර ස්වභාවය | වර්ගය | ව්‍යාපාර ස්වභාවය | වර්ගය | ව්‍යාපාර ස්වභාවය | වර්ගය |
|---|---|---|---|---|---|
| කර්මාන්ත | විශාල | කෘෂිකර්මය/ ධීවර/පශු සම්පත් | විශාල | සංචාරක/ ආගන්තුක සත්කාර/සේවා | විශාල |
| | මධ්‍යම | | මධ්‍යම | | මධ්‍යම |
| | සුළු පරිමාණ | | සුළු පරිමාණ | | සුළු පරිමාණ |
| | ක්ෂුද්‍ර | | ක්ෂුද්‍ර | | ක්ෂුද්‍ර |

- විශේෂ තේමාවන් යටතේ සම්මාන (6)
  - හොඳම පරිසර හිතකාමී ව්‍යවසාය
  - හොඳම අපනයනකරු
  - හොඳම නිෂ්පාදන ව්‍යවසාය
  - හොඳම නවෝත්පාදන ව්‍යවසාය
  - හොඳම අගය එකතු කළ ව්‍යවසාය
  - හොඳම බලශක්ති කාර්යක්ෂම ව්‍යවසාය

- හොඳම දිස්ත්‍රික් ව්‍යවසාය සම්මාන (36)
  අංශ 3 ඔස්සේ ප්‍රමාණ 4 කින් දිස්ත්‍රික්ක 3 ට = සම්මාන 36
  දිස්ත්‍රික්ක 3 (මහනුවර, මාතලේ, නුවර එළිය)

| ව්‍යාපාර ස්වභාවය | වර්ගය | ව්‍යාපාර ස්වභාවය | වර්ගය | ව්‍යාපාර ස්වභාවය | වර්ගය |
|---|---|---|---|---|---|
| කර්මාන්ත | විශාල | කෘෂිකර්මය/ ධීවර/පශු සම්පත් | විශාල | සංචාරක/ ආගන්තුක සත්කාර/සේවා | විශාල |
| | මධ්‍යම | | මධ්‍යම | | මධ්‍යම |
| | සුළු පරිමාණ | | සුළු පරිමාණ | | සුළු පරිමාණ |
| | ක්ෂුද්‍ර | | ක්ෂුද්‍ර | | ක්ෂුද්‍ර |

**10. ප්‍රකාශනය සහ අත්සන**

- අයදුම්කරු අයදුම්පතෙහි අත්සන් කර දිනය සඳහන් කළ යුතුය.
- අත්සන් නොකළ අයදුම්පත පිළිගනු නොලැබේ.

**11. ඉදිරිපත් කිරීමේ ක්‍රමය සහ ගොනු ආකෘතිය**

- අයදුම්පත් අතින් රැගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක. (මුල් අයදුම්පත සහ ඇමුණුම් ඉදිරිපත් කරන්න)
- අයදුම් පත යොමු කළ යුතු ලිපිනය **මාතලේ දිස්ත්‍රික් වාණිජ, කර්මාන්ත සහ කෘෂිකර්ම මණ්ඩලය, 75/2/2 රජ වීදිය, මාතලේ**
- කාර්යාල වේලාවන්: පෙ.ව. 9:00 - ප.ව. 4:30 (සඳුදා - සිකුරාදා)
- අයදුම්පත් ගාස්තුව:

| කාණ්ඩය | අයදුම්පත් ගාස්තුව (රු.) |
|---|---|
| ක්ෂුද්‍ර | 1,500.00 |
| සුළු පරිමාණ | 5,000.00 |
| මධ්‍යම පරිමාණ | 7,500.00 |
| විශාල පරිමාණ | 10,000.00 |

- කරුණාකර අයදුම්පත් ගාස්තුව තැන්පත් කරන්න:

| | |
|---|---|
| බැංකුව | : ලංකා බැංකුව, මාතලේ ශාඛාව |
| ගිණුම් නම | : මාතලේ දිස්ත්‍රික් වාණිජ, කර්මාන්ත සහ කෘෂිකර්ම මණ්ඩලය |
| ගිණුම් අංකය | : 827 33 895 |

**12. අයදුම්පත් ලැයිස්තුව**

අයදුම්පත සමඟ පහත දැක්වෙන ලියකියවිලි ඇත්දැයි තහවුරු කරගන්න:

- සම්පූර්ණයෙන් පුරවා නිමකළ අයදුම්පත.
- අයදුම්කරුගේ අත්සන සහ දිනය.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත.
- ජාතික හැඳුනුම්පත (NIC) පිටපත.
- මූල්‍ය ප්‍රකාශන
- EPL සහතික (අදාළ නම්).
- ඡායාරූප සහ සනාථ කළ හැකි ලියවිලි
- සියලුම ලියකියවිලි නිවැරදිව අංකනය කරන්න.
- ගෙවීම් ලදුපත/අන්තර්ජාල ගෙවීම් තහවුරුව (Online Banking Slip) ඉදිරිපත් කරන්න.

**13. තෝරා ගැනීමේ ක්‍රියාවලිය සහ ඇගයීම**

- නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද හා අදාළ වර්ගීකරණයට අයත්වන අයදුම්පත් සුදුසුකම් සහ සම්පූර්ණත්වය සඳහා පරීක්ෂා කරන ලද අයදුම්පත්.
- ඇගයීමේ දී ලකුණු ලබා දෙන ආකාරය

| නිර්ණායක | බර තැබීම (%) |
|---|---|
| මූල්‍ය කාර්ය සාධනය | 10 |
| ව්‍යාපාරික දැක්ම | 10 |
| නවෝත්පාදනය / තාක්ෂණය අනුගත වීම | 15 |
| ගෝලීය සහ දේශීය වෙළඳපල ප්‍රවේශය | 10 |
| වෙළඳපල කොටස / විකුණුම් කාර්යක්ෂමතාව | 10 |
| රැකියා උත්පාදනය | 10 |
| ඵලදායිතාව | 15 |
| ආයතනික සමාජ වගකීම (CSR) | 10 |
| බලශක්ති කාර්යක්ෂමතාව සහ පාරිසරික කළමනාකරණය | 10 |
| **එකතුව** | 100 |

**14. රහස්‍යභාවය**

මෙම අයදුම්පතෙහි සඳහන් කරනු ලබන සියලුම තොරතුරු මෙම කාර්යය සඳහා පමණක් යොදාගනු ලබන අතර එම තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

**15. විමසීම් සඳහා සම්බන්ධ වන්න**

| | |
|---|---|
| නම | : ගිහාන් වෙලගෙදර මයා /ෆයිසාල්ඩීන් මයා |
| දුරකථන | : 070 222 4000 |
| විද්‍යුත් තැපැල | : projects.matalechamber@gmail.com |